# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2199/20 - 2020 ඔක්තෝබර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1)වන උපවගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි 2020 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ලෙස හඳුන්වනු ලැබේ.

2. 2018 ජුනි මස 18 වැනි දිනැති අංක 2076/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 ඔක්තෝබර් මස 03 වැනි දිනැති අංක 2143/36 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* 2020 මැයි මස 22 වැනි දිනැති අංක 2176/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2020 ජුනි මස 30 වැනි දිනැති අංක 2182/10 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* සහ 2020 අගෝස්තු මස 17 වැනි දිනැති අංක 2189/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධනය කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක I දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I වන සහ II වන තීරයේ දැක්වෙන අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III සහ IV වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

1A - PG 5212 — 520 (2020/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංකය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව ආනයන පාලන බලපත්‍ර (L) |
|---|---|---|---|---|---|
| 234 | 17.01 | | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස්. | |
| | | | - | එකතුකරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි : | |
| | | 1701.12.00 | - - | බීට් සීනි | L |
| | | 1701.13.00 | - - | උක් සීනි මෙම පරිච්ඡේදයේ දෙවන සටහනෙහි වෙසෙසින් සඳහන් කොට ඇති | L |
| | | 1701.14.00 | - - | අනෙකුත් උක්සීනි | L |
| | | | - | අනෙකුත් : | |
| | | 1701.91.00 | - - | එකතු කරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු : | |
| | | 1701.91.10 | - - - | සීනි | L |
| | | 1701.91.90 | - - - | අනෙකුත් | L |
| | | 1701.99.00 | - - | අනෙකුත් : | |
| | | 1701.99.10 | - - - | සුදු ස්ඵටිකකෘත උක් සීනි | L |
| | | 1701.99.20 | - - - | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | L |
| | | 1701.99.30 | - - - | අනෙකුත් සීනි | L |
| | | 1701.99.90 | - - - | අනෙකුත් | L |

3. 2016 නොවැම්බර් මස 11 වැනි දිනැති අංක 1992/74 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2017 ඔක්තෝම්බර් මස 02 වැනි දිනැති අංක 2039/04 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2019 දෙසැම්බර් මස 06 වැනි දිනැති අංක 2152/63 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය*, 2020 ජුනි මස 30 වැනි දිනැති අංක 2182/10 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* සහ 2020 අගෝස්තු මස 17 වැනි දිනැති අංක 2189/4 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත 2016 පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද, විශේෂ ආනයන බලපත්‍ර ගාස්තු නියෝගයන්හි සඳහන් අංක I දරන උපලේඛනයට පහත සඳහන් අයිතම සහ ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුලත් කරනු ලැබේ.

| අංකය | අයිතමය | ආනයනය පාලන බලපත්‍ර ගාස්තුව |
|---|---|---|
| 59 | සීනි | මි.ර.ගැ. වටිනාකමින් 0.4% |

4. මෙම රෙගුලාසි 2020 ඔක්තෝබර් මස 30 දින සිට ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.